Prepared by- පී.ටී.එම්.ආර්.ආර්.ආර්.ඒකනායක

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

ක්‍රියාකාරකම 1.4.1- සතර අභිනය භාවිතය

අභි + නය යනු කුමක්ද ?

- "අභි " යන්න ඉදිරියට යන අරුත දේ... " නය" යන්න පැම හෙවත් පැමිණවීම.එනම් නළු නිළියන් පිරිසක් විසින් කිසියම් සිදුවීමක් හෝ කථාවක් ප්‍රේක්ෂක සමූහයා වෙත ඉදිරිපත් කිරීමට ගන්නා මාධ්‍යය අභිනය වේ.එලෙස ඉදිරිපත්කෙරෙන අභිනය විධි සිව් වැදෑරුම් වේ.එය සතර අභිනය නම් වේ.

  සතර අභිනය
  1.ආංගික අභිනය
  2.වාචික අභිනය
  3.සාත්වික අභිනය
  4.ආහාර්ය අභිනය නම් වේ.






ආංගික අභිනය :-

නාට්‍යක ප්‍රධාන අංගයක් වන්නේ චරිත රඟ දක්වන නළුවන්ය.නාට්‍යයේ සිදුවීම් ප්‍රේක්ෂකයා වෙත ගෙනයන්නේ නළු,නිළියන් විසිනි.නළු නිළියන්ගේ ප්‍රධාන අංගය වනුයේ ශරීරයයි.ශරීරයේ චලන අර්තවත් අයුරින් උපයෝගී කරගනිමින් මනා පුහුණුවකින් යුක්තව සිදුකරන ඉදිරිපත් කිරීම ආංගික අභිනය වේ.මේ සඳහා නළුවාගේ ශරීරය ප්‍රධාන කොටස් 3කට බෙදාවෙන්කල හැක. ඒ අංග,ප්‍රත්‍යංග,උපාංග යනුවෙනි.

I. අංග - ( හිස,පපුව,අත්,පාද,උකුළ )
II .ප්‍රත්‍යංග- ( බෙල්ල,උරහිස,හාහු,මැණික්කටුව,කලවා,වැලමිට,දණහිස )
III. උපාංග- ( ඇස්,ඇස් පිහාටු,ඇහිබැම,කම්මුල,නාසය,කන්,දත්,දිව,හක්ක,දෙතොල්,නිකට)

වාචික අභිනය :-
නාට්‍ය පෙළක සුවිශේෂ ලක්ෂණයක් ලෙස නාට්‍ය සංවාද ( දෙබස් ) හැඳින්විය හැක. නාට්‍යපෙළෙහි ඇති සංවාද ඒ ඒ අවස්ථාවන් හි නාට්‍ය චරිතවල මනෝභාවයන් අර්ථ නිරූපනය වනසේ හඬ උස් පහත් කරමින්, ( විරාම,ප්‍රශ්නාර්ත,යටිපෙළ අරුත්,මුකරි වදන්,දූත,සතුට,භීතිය,හාස්‍ය) ගීත,කවි,සිංදු ගායනා කිරීම නාට්‍යයේ ශෛලින් අනුව රිද්මයානුකූලව හා ස්වාභාවිකව මනා පුහුණුවකින් යුතුව උච්චිරණය කිරීම වාචික අභිනය ලෙස හැඳින්විය හැක.

සාත්වික අභිනය :-
නළුවෙකුගේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස මුහුණ හැඳින්විය හැකිය.නාට්‍ය රඟ දක්වන නළු නිළියන් නාට්‍යයේ චරිත ස්වභායන් අනුව හා ඒ ඒ අවස්ථාව අනුව ඇතිවන මනෝභාවයන් ,හැඟීම් අර්ථ නිරූපනය කිරීමට අදහස් ප්‍රකාශ කිරීමට මුහුණ උපයෝගී කරගනී.ඒ අනුව රඟ දක්වන චරිතයට අදාල සියළු මානුෂීය හා සත්ත්ව හැඟීම් ( දුක,සතුට,භය,කරුණාව,ආදරය,පිළිකුල,ඇස් රතුවීම්,හැඩීම්,දහදිය දැමීම,කම්මුල් රතුවීම,විරිත්තීම,දත්මිටිකෑම)මුහුණේ මාංශපේෂීන් උපයෝගී කර ගනිමින් මනා පුහුණුවකින් යුතුව නාට්‍යයට උචිත අයුරින් ඉදිරිපත් කිරීම සාත්වික අභිනය වේ.

ආහාර්ය අභිනය :-

නාට්‍යයක් සාර්තක කර ගැනීම සඳහා ආහාර්ය අභිනය අත්‍යවශ්‍යයවේ.අප ඉහත සාකච්ඡා කල අභිනයන් නළු,නිළියන් විසින් සිදු කල යුතු කාර්යයන් වන අතර අහාර්ය අභිනය හෙවත් අනුශාංගික අංග නළුවාට පරිභාහිරින් නාට්‍ය හා සම්බන්ද අනෙකුත් කලා අංග නළුවාගේ රංග කාර්යය පහසු කරගැනීම සඳහා නළුවාට උපයෝවන අංගවේ.ඒ අනුව රංග වස්ත්‍රාභරණ,රංග භාණ්ඩ,පසුතල නිර්මාණ,අංග රචනය,නාට්‍ය සංගීතය,රංගාලෝකය වැනි අංග සඳහන් කල හැකිය.එසේම මෙම අංග භාවිතයේදී නාට්‍යයේ ශෛලිය,ස්වභාවය,අවස්ථාවන්,චරිත ස්වභාවයන් අනුව භාවිතා කලයුතු අතර,ප්‍රේක්ෂකයාට වඩාත් පහසුවෙන් නාට්‍ය හා බැඳීමට මෙම අනුශාංගික අංග උපකාරීවේ.

පැවරුම්

1. අභිනය යුනු කුමක්ද ? කෙටියෙන් හඳුන්වන්න.
2. අහාර්ය අභිනය යනු කුමක්ද ?
3. සාත්වික අභිනය සාර්ථකව සිදු කිරීම සඳහා නළුවා විසින් සිදු කල යුතු අභ්‍යාස මොනවාද ?
4. ආංගික අභිනය සාර්ථකව සිදු කිරීම සඳහා නළුවා විසින් සිදු කල යුතු අභ්‍යාස මොනවාද ?
5. ආනුශාංගික අංග යනු මොනවාද ?